# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/2017

## PSC -2238 - ශ්‍රී ලංකාවේ නාගරික සහ ග්‍රාමීය දේශපාලනය

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට** ( 03 ) පමණක් පිළිතුරු සපයන්න

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20)**

---

01. (අ) යටත් විජිත දේශපාලන ආර්ථිකයේ ගති ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ආ) යටත් විජිත දේශපාලන ආර්ථිකය ශ්‍රී ලංකාවේ නූතන නගර සැකැස්ම කෙරෙහි බලපෑවේ කෙසේ ද?

02. 19 වන සියවසයේ අග භාගයේ දී සහ 20 වන සියවසයේ දී ශ්‍රී ලාංකීය නාගරික දේශපාලනය තුළ පැන නැගුණු ජනවාර්ගික හා ආගමික දේශපාලනයේ සමාජ-ආර්ථික මූලාශ්‍රයන් විශ්ලේෂණය කරන්න.

03. (අ) නිදහසින් පසු යුගයේ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ ආශ්‍රිත ගැටලු පැහැදිලි කරන්න.

(ආ) එම ගැටලු 1970 දශකයේ ග්‍රාමීය තරුණ රැඩිකල්වාදය කෙරෙහි දැක්වූ දායකත්වය කෙබඳු ද?

04. සමකාලීන ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය පක්ෂ දේශපාලනය තුළ පවතින අනුග්‍රාහක - සේවාදායක සම්බන්ධතාවල ප්‍රධාන ගති ලක්ෂණ මොනවා ද? විස්තර කරන්න.

05. 1977 ආර්ථික විවෘතකරණ ප්‍රතිපත්තීන් හඳුන්වා දීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ප්‍රභූ දේශපාලනයේ සහ තරුණ රැඩිකල්වාදයේ ඇති වූ නව ගති ලක්ෂණ විශ්ලේෂණය කරන්න.

06. සමකාලීන ශ්‍රී ලාංකීය දේශපාලනය තුළ ජනමාධ්‍යවල භූමිකාව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

*******************